වෙළුම අංක 23
කලාපය. 03

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය
සැප්තැම්බර් 2025
INFORMATION



2025 උපාධි ලාභීන්

# “ලොවක් බලා සිටී, අස්වැන්න සූදානම්, ස්වාමින්වහන්සේ ඔබ සමඟය.”

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධි ප්‍රදානෝත්සවවල, “පැවරීම” නම් විශේෂ සම්ප්‍රදායක් අපට ඇත. මෙම කෙටි හා බැරෑරුම් ක්‍රියාව සිදුවන්නේ ඩිප්ලෝමා සහ උපාධි ප්‍රදානය කිරීමෙන් පසුවය. අපගේ උපාධිධාරීන්ට, ක්‍රිස්තුස් වහන්සේගේ සේවකයන් ලෙස ඔවුන්ගේ උසස් කැඳවීම සිහිපත් කර දීමේ සහ මෙම පූජනීය විශ්වාසය රක්ෂා කරන ලෙස ඉල්ලා සිටීමේ කාර්යය පැවරෙන්නේ කවුන්සිලයේ සාමාජිකයෙකුට හෝ වෙනත් ජ්‍යෙෂ්ඨ ක්‍රිස්තියානි නායකයෙකුට ය.

ස්වාමින් වහන්සේගේ සේවකයෙකුට ක්‍රිස්තුස් වහන්සේ යටතේ ඔහුගේ වගකීම් බැරෑරුම් ලෙස “පැවරූ” නව ගිවිසුමේ අවස්ථා දෙකකින් මෙම “පැවරීම” සඳහා ආභාසය ලැබී ඇත. පාවුලුතුමා තිමෝති සමඟ කළ ලිපි හුවමාරුවේ මේවා දක්නට ලැබේ (1 තිමෝති 5:21; 2 තිමෝති 4:1):

එම අවස්ථා දෙකේදීම, පාවුලුතුමා නෛතික අර්ථයකින් යුතු භාරදූර ඩයමාර්ටුරෝමයි *(diamarturomai)* යන ග්‍රීක වචනය භාවිත කිරීම විශේෂත්වයකි: “මම ඔබට නියෝග කරමි.” “දෙවියන් වහන්සේ සහ ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ ඉදිරියෙහි” යන එක සමාන වාක්‍ය ඛණ්ඩය එකතු කිරීමෙන් පාවුලුතුමා එම අවස්ථා දෙකේ භාරදූරත්වය මතුකර දක්වයි.

## විදුහල්පතිතුමාගේ පණිවිඩය



**අයිවෝ පූබාලන්, PhD**
විදුහල්පති

1 තිමෝති 5:21හි එතුමා තිමෝතිට අණ කරන්නේ, “පූර්ව නිගමනවලින් හා පක්ෂවාදීකම්වලින් තොරව” ඔහුගේ සේවය ඉටු කරන ලෙසය: ස්වාමීන් වහන්සේගේ අවංක සේවකයෙකු වීමට ඔහු තිමෝති උනන්දු කරයි.

2 තිමෝති 4:1-5 හි ඔහු තිමෝතිට “වචනය දේශනා කරන්න” සහ “ධර්මදූත සේවයේ යෙදෙන්න” යැයි අණ කරයි. ස්වාමීන් වහන්සේගේ විශ්වාසවන්ත සේවකයෙකු වීමට ඔහු මෙහිදී තිමෝති උනන්දු කරයි.

උපාධි ප්‍රදානෝත්සවය හා පැවරුමෙන් පසු, සෑම කොළඹ දේවධර්ම ශාස්ත්‍රලයේ උපාධිධාරියෙකුම සෑහෙන කාලයක් පුරා, අවංකත්වය සහ විශ්වාසවන්තභාවය සඳහා ප්‍රසිද්ධියක් උසුලන ක්‍රිස්තියානි නායකයන් වනු ඇතැයි අපි යාච්ඤා කරමු.

2025 ජූලි මාසයේ පවත්වන ලද, 15 වන උපාධි ප්‍රදානෝත්සවයේදී, කවුන්සිලයේ උප සභාපති, ගෞ. රොමේෂ් බුලත්සිංහල දේවගැතිතුමා එම “පැවරීම” ප්‍රබල ලෙස ඉදිරිපත් කරන ලදී. මෙම In-Formation සංස්කරණයෙන් එය මෙසේ යළි ඉදිරිපත් කරමු.

**ආදරණීය උපාධිධාරීන්,**

අද ඔබ හුදෙක් අධ්‍යාපනය අවසාන කරන දිනය පමණක් නොව, එය ඔබගේ පූජනීය වගකීමේ ආරම්භයයි.

ඔබ වචනය ඉගෙනගෙන, එහි ගැඹුර අධ්‍යයනය කර, එහි සත්‍යතාවයන් ගැන යාච්ඤා කර, එහි ඉල්ලීම් සමඟ පොරබදින්නට යෙදුණි. සන්නද්ධ ව සිටින ඔබට දැන් යමක් භාර දෙනු ලැබේ. මෙය අතරමැදි අවධියක් නොව, මෙය පිටත්කර යැවීමකි.

දෙවියන් වහන්සේගේ සේවකයෙකු සහ උන්වහන්සේගේ මිදි වත්තේ හවුල් ශ්‍රමිකයෙකු ලෙස මම අද ඔබට ආඥාවක් දෙන්නෙමි:

**විශ්වාසවන්තව සහ නිර්භීතව වචනය දේශනා කරන්න**

ඝෝෂාවෙන් හා රැවටීමෙන් පිරුණු ලෝකයක සුබාරංචියේ වෙනස් නොවන සත්‍යය ප්‍රකාශ කිරීමට ඔබව කැඳවා ඇත. අපෝස්තුලු පාවුල්තුමා තිමෝතිට ලියූ පරිදි, "වචනය දේශනා කරන්න; කලටත්, අකලටත් සූදානමින් සිටින්න; වරද පෙන්වා දීමත්, තරවටු කිරීමත්, දිරිගැන්වීමත් කළ යුත්තේ, පූර්ණ ඉවසීමෙන් හා උපදෙසින් යුතුව ය."

කාලයට ගැලපෙන පරිදි පණිවිඩය බාල නොකරන්න. ජනප්‍රියත්වය වෙනුවෙන් විශ්වාසය පාවා නොදෙන්න. ස්ථිරව සිටින්න. සත්‍ය කතා කරන්න.

**ඔබ සත්‍යය ලුහුබැඳ යන අතර, යේසුස් වහන්සේ කෙරෙහි වැඩි ප්‍රේමයක් ඇති වේවා.**

දේවධර්මයේ ඉලක්කය තොරතුරු රැස් කිරීම නොව, වෙනසක් ඇති වීමය.

ඔබේ බුද්ධිය තියුණු කර ගැනීමට පමණක් නොව, යේසුස් වහන්සේට සමීපවීම උදෙසා ශුද්ධ ලියවිල්ල අධ්‍යයනය කරන්න.

අපෝස්තුලු පාවුල්තුමා කිවූ පරිදි: 'මට වුවමනා ක්‍රිස්තුස් වහන්සේ හා උන්වහන්සේගේ නැවත නැගිටීමේ බලය දැනගැනීමටත්, උන්වහන්සේගේ මරණයෙන් උන්වහන්සේ හා සමාන බවට පත් වීමටත්ය...' (පිලිප්පි 3:10).

ඔබ වචනයේ ගත කරන සෑම මොහොතක්ම ඔබව උන්වහන්සේගේ හදවතට සමීප කරත්වා.

මන්ද ඔබේ අධ්‍යයනයේදී ඔබට ක්‍රිස්තුස් වහන්සේව මගහැරුණා නම්, ඔබට හැමෙකක්ම මඟ හැරී ඇත.

**ඔබ දේශනා කරන ලෙසට ජීවත් වන්න**

ඔබේ චරිතය ඔබේ පණිවිඩයෙන් ප්‍රතිරාවය විය යුතුය. ඔබේ ජීවිතය සියලු දෙනා විසින් කියවන ජීවමාන ලිපියක් වේවා. ශුද්ධකම, නිහතමානීකම සහ ප්‍රේමය, ප්‍රසිද්ධියේ පමණක් නොව රහස් ස්ථානවලදීත් ලුහුබඳින්න.

ඔබව කැඳවා ඇත්තේ ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් කතා කිරීමට පමණක් නොව උන්වහන්සේව පිළිබිඹු කිරීමටත් බව මතක තබා ගන්න. හොඳින් ගතකළ ජීවිතය වඩාත්ම ඒත්තු ගැන්වෙන දේශනාවය.




දේවගැති රොමේෂ් බුලත්සිංහල (CTS කවුන්සිලයේ උප සභාපති) උපාධිධාරීන්ට පැවරීම භාර දෙයි.
දේවගැති රොමේෂ් බුලත්සිංහල දෙපස සිටින්නේ පිළිවෙලින් දෙමළ සහ සිංහල භාෂාවට මෙම පැවරීම පරිවර්තනය කළ පීඨ සාමාජිකයන් වන ජූලියන් දේවදාසන් (වමේ) සහ මිෂෙල් පීරිස් (දකුණු) යන අය වේ.

**සභාවට සේවය කර නැතිවූවන් සොයා යන්න**
ඔබව කැඳවා ඇත්තේ සුවපහසු දිවියකට නොව, යවන පිණිසය. සභාව ගොඩනගන්න. ජනතාවට ප්‍රේම කරන්න. බිඳුණු අයව ඔසවන්න. ලොව පුරා ගොස් ගෝලයන් කිරීමේ මහා නියෝගය කිසිවිටකත් අමතක නොකරන්න. සුපිරි තරුවක් නොව එඬේරෙකු වන්න.

**දුෂ්කරතා විඳ දරාගනිමින් හරි මඟ රැඳී සිටින්න**
දේව සේවය වේදිකාවක් නොව, යුද පිටියකි. විරෝධතා, වෙහෙස සහ නිහඬත්වය පවා තිබෙනු ඇත. නමුත් "ඔබව කැඳවූ තැනන් වහන්සේ විශ්වාසවන්තය". ගින්න තුළින් යනවිට, එයට ඔබව විනාශ කරන්නට නොව, පවිත්‍ර කිරීමට ඉඩ දෙන්න. අධෛර්යමත් වන විට කුරුසිය පාමුලට දුවන්න.

**දෙවියන් වහන්සේගේ අභිමුඛයේ මුල් බැස ගන්න**
අන් සියල්ලටම වඩා උන්වහන්සේට ළංව සිටින්න. ඔබේ සාර්ථකත්වය ඇත්තේ උපායමාර්ග තුළ නොව ස්වාමීන් වහන්සේට සමීපව සිටීමෙන්ය. ආලේපය ගලා එන්නේ තනතුරකින් නොව උන්වහන්සේ සමඟ කාලය ගත කිරීමෙනි. රහස් ස්ථානය සැමවිටම ඔබේ මූලාශ්‍රය සහ ශක්තිය වේවා!

**මෙම ශාස්ත්‍රාලයේ නායකත්වය වන අපි දැන් ඔබව පිටත් කර හරිමු.**

**යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් ඉදිරියට යන්න.**
සත්‍යයෙන් හා ප්‍රේමයෙන් වචනය දේශනා කරන්න.
ඔබට ලැබී ඇති කැඳවීමට වටිනාකමක් දෙන පරිදි ජීවිතය ගත කරන්න.
සභාව ගොඩනගන්න. නැතිවූවන් සොයා යන්න.
කරදර මැදදී ස්ථිරව සිටින්න. නිහතමානීව සේවය කරන්න.
සියල්ලටම වඩා ඔබේ දෙවියන් වහන්සේට සමීපව ගමන් කරන්න.

**මක්නිසාද ලෝකය බලා සිටී.**
**අස්වැන්න සූදානම්ය.**
**සමිඳාණන් වහන්සේ ඔබ සමගය.**

ඔබ මෙම ස්ථානයෙන් පිටතට යන විට ක්‍රිස්තුස් වහන්සේගේ අධිකාරිත්වයෙන්, ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් සහ පියාණන් වහන්සේගේ ප්‍රේමයෙන් යන්න. ධෛර්යවත්වන්න. විශ්වාසවන්තවන්න.

යේසුස් වහන්සේගේ නාමයෙන් අපි ඔබට ආඥා කරමු. ආමෙන්!

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි ස්තුති දීමේ සහ පැවරීමේ 15 වන උපාධි ප්‍රදානෝත්සවය 2025 ජූලි 19 වන දින, පවත්වන ලදී. එදින සිසුන් 165 දෙනෙකුට සහතික, ඩිප්ලෝමා, උපාධි සහ පශ්චාත් උපාධි පිරිනමන ලදී. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් නව පොත් එකොළහක් එළිදැක්විණි.



මෙම ත්‍රෛභාෂා දේව මෙහෙය, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය සංවිධානය කළ දෙවන සමස්ත ලංකා උපාධි ප්‍රදානෝත්සවය විය. පළමු වරට, සම්මානලාභීහු දිවයිනේ පළාත් 9 මෙන්ම ශ්‍රී ලාංකික ඩයස්පෝරාව ද නියෝජනය කළහ!

මෙවර නව අධ්‍යයන විෂය ධාරා දෙකකින් උපාධි ලබාගත් ශිෂ්‍යයන් විය. 2021 දී ආරම්භ වූ උපදේශනය පිළිබඳ කලා ශාස්ත්‍රපති විෂය ධාරාවේ පළමු සිසුන් කණ්ඩායමෙන් 7 දෙනෙකු මෙම උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධි ලබා ගත්හ.



ළමා සේවා විෂය ධාරාවේ පළමු සහ දෙවන කණ්ඩායම් (65 දෙනෙකු) සහතික ලබා ගන්නා ලදී.

මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් පැමිණියේ, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි පළමු කවුන්සිලයේ සාමාජිකයෙකු මෙන්ම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ඉරාන් වික්‍රමරත්න මහතාය. “ප්‍රඥාවෙන් පිරුණු සහ විචාර බුද්ධියෙන් මඟ පෙන්වනු ලබන ඇදහිල්ලේ ජීවිතයක්” නම් ඔහුගේ පණිවිඩය මහත් අභියෝගයක් ගෙන ඒමට සමත් විය.





උපාධිය ලැබූවෝ සභාව තුළත්, ඉන් පිටතත් විවිධ භූමිකාවල නියැළී සිටිති. ඔවුන් කථිකාචාර්යවරුන්, ආරක්ෂකන්, බේකරිකරුවන්, තරුණ නායකයන්, ධර්මදූතකයන්, අධ්‍යක්ෂවරුන්, උපදේශකයන්, දේවගැතිවරුන්, ළමා සේවකයන්, පුස්තකාලයාධිපතිවරුන්, නීතිඥයන්, නමස්කාරය මෙහෙයවන්නන්, රියදුරන්, වතු කම්කරුවන්, මාර්ගෝපදේශකයන්, ඇඳුම් මසන්නන් සහ වෙනත් ආකාරවලින් දායක වෙති.











## සමස්ත ලංකා උපාධිධාරීන්ගේ ශුද්ධානකාන්ති වැඩසටහන

### (කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ කඳවුරු පරිශ්‍රය, මාදම්පේ)

ජූනි මාසයේදී, ඔවුන්ගේ උපාධි ප්‍රදානෝත්සවයට සූදානම් වීමක් ලෙස, රට පුරා අධ්‍යයන මධ්‍යස්ථානවලින් ඩිප්ලෝමා, උපාධි සහ ශාස්ත්‍රපති මට්ටමේ සම්මානලාභීහු මෙනෙහි කිරීම, විවේක ගැනීම සහ ඔවුන්ගේ කැඳවීම්වලට නැවත කැපවීම සඳහා දින දෙකක් එකතු වූහ. ශුද්ධානකාන්ති වැඩසටහනේ නායකයා වූයේ කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි පළමු සභාපති අජිත් ප්‍රනාන්දු ය.
















## විශේෂ දැනුම් දීම

# කොළඹ දේවධර්ම ශාස්ත්‍රලය සහ චිකාගෝ හි වීට්න් විද්‍යාලය, අධ්‍යයන හවුල්කාරිත්වයකට එළඹේ.

2018 සිට, කොළඹ දේවධර්ම ශාස්ත්‍රලය සහ වීට්න් විද්‍යාලය, හවුල් සබඳතාවකට එළඹ ගුරුවරුන්ට සහ සිසුන්ට අන්තර් සංස්කෘතික ඉගෙනීමක් සහ වර්ධනයක් ලබා දෙමින් ක්‍රිස්තු කේන්ද්‍රීය උපදේශන කටයුතු තුළින් කොන්වීමට ලක්වූවන්ට සහ ගෝලීය සභාවට සේවය කිරීමට අවස්ථා උදාකර දීමට පොදු දර්ශනයක් ඇතිව කටයුතු කර ඇත. මෙම වසරේ ජූලි මාසයේ මෙම හවුල්කාරිත්වය විධිමත් කරන ලදී. අන්‍යෝන්‍ය වශයෙන් සාරවත් අධ්‍යයන කටයුතු සහ අධ්‍යයන හවුල්කාර අවස්ථා සඳහා සහයෝගයෙන් කටයුතු කිරීමට අධ්‍යාපන ආයතන දෙකම බලාපොරොත්තු වේ. ආසියානු දේවධර්ම සංගමය ද පිළිගෙන ඇති මෙම උපදේශන වැඩසටහන තවදුරටත් සාක්ෂාත් වීම ගැන කොළඹ දේවධර්ම ශාස්ත්‍රලය බොහෝ සේ කෘතඥ වේ.



වමේ සිට දකුණට සිටගෙන සිටින්නේ: ගෞ. රවින් කල්දේරා, අධ්‍යාපන පීඨාධිපති; ආචාර්ය අයිවෝ පූබාලන්, විදුහල්පති; ආචාර්ය ටෙරී වොට්සන්, මනෝවිද්‍යා කථිකාචාර්ය, වීට්න් විද්‍යාලය, ඇමෙරිකා එක්සත් ජනපදය; ආචාර්ය මැන්ඩි කැලම්-බරාකා, ඇමරිකා එක්සත් ජනපදයේ වීටන් විද්‍යාලයේ සායනික මානසික සෞඛ්‍ය උපදේශනය පිළිබඳ සහකාර මහාචාර්ය; ඩිලීනි ඒබ්‍රහම්, උපදේශන පාඨමාලා නායිකාව; ආචාර්ය මනෝ එමානුවෙල්, අධ්‍යයන ප්‍රවර්ධන අංශ ප්‍රධාන; සින්දුජා සෙල්ලියා, උපදේශන වැඩසටහන් සම්බන්ධීකාරක.

## උපදේශන සම්මන්ත්‍රනය

# අනුග්‍රහයේ අවකාශ: අනුග්‍රහය බහුල තැන, පරිවර්තනය සිදුවේ




ජුනි මාසයේදී, විවිධ සභාවලින් 70 කට අධික පිරිසක් මෙම විශේෂ සම්මන්ත්‍රණයට සහභාගී වූහ. මෙම සම්මන්ත්‍රණයේදී 'අනුග්‍රහය පිළිබිඹු කිරීම' (සභාව තුළ), 'අනුග්‍රහය යළි පිහිටුවීම' (පුද්ගලයෙකු ලෙස ආරක්ෂිත අවකාශයක් වීම) සහ 'අනුග්‍රහය පෝෂණය කිරීම' (කරුණාවෙන් පිරුණු නිවසක් නිර්මාණය කිරීම) යන මාතෘකා යටතේ වැඩමුළු 3 ක් සහ පූර්ණ සැසියක් පැවැත්විණි. වැඩමුළු තුනම මෙහෙයවනු ලැබුවේ අපගේම උපදේශන විෂය ධාරාවේ ආදි ශිෂ්‍යයන් විසින් වීම විශේෂ කාරණයක් විය!

## GATE ආචාර්ය මණ්ඩල පුහුණුව

# ගෝලීය දේවධර්ම අධ්‍යාපනඥයන්ගේ සංගමය විසින් පවත්වනු ලබන සිවු අවුරුදු ආචාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන

ගෝලීය දේවධර්ම අධ්‍යාපනඥයන්ගේ සංගමය විසින් පවත්වන ලද දෙවන වසරේ පුහුණුව තුළින් කොළඹ දේවධර්ම ශාස්ත්‍රලයේ ආචාර්ය මණ්ඩල (පූර්ණකාලීන සහ බාහිර) සාමාජිකයෝ විසි දෙනෙක් ද, වෙනත් දේශීය බයිබල් ශාස්ත්‍රාල සහ බයිබල් විද්‍යාල හතරක ආචාර්ය මණ්ඩල සාමාජිකයෝ ද මහත් ආශීර්වාද ලබාගත්හ. ආසියානු දේවධර්ම සංගමය (ATA) විසින් පහසුකම් සපයන ලද 'පරිවර්තනීය අධ්‍යාපනය සඳහා ඉගැන්වීමේ ක්‍රම' නම් වූ ආචාර්ය මණ්ඩල පුහුණුවට දේවධර්ම අධ්‍යාපනඥයන් හැට එක් දෙනෙකු සහභාගී වූහ. ඒ සඳහා ආචාර්ය ගැරී ග්‍රිෆිත් සහ ආචාර්ය ජොආනා ෆෙලිසියානෝ-සොබෙරානෝ දායක වූහ.




# කොළඹ දේවධර්ම ශාස්ත්‍රල මූලස්ථානයෙහි බාහිර කථිකාචාර්යවරුන්

### 'ගෝලීය සාක්ෂිය සඳහා බයිබල් පදනම්'

MA පාඨමාලාව
ජෝන් ඩැනියෙල්, MTh, PhD, SAIACS, ඉන්දියාව



දෙවියන් වහන්සේගෙන් ආරම්භ වූ, ශුද්ධාත්මයාණන් විසින් බලගන්වන ලද, ගෝලීය ධර්මදූතනය සඳහා බයිබලයානුකූල පදනම් පරීක්ෂා කර බැලීම.

### 'විවාහක යුවල සඳහා උපකාරක'

MA පාඨමාලාව
මනෝවිද්‍යාව පිළිබඳ මහාචාර්ය ආචාර්ය ටෙරී වොට්සන්,
වීටන් විද්‍යාලය, ඇමරිකා එක්සත් ජනපදය



පශ්චාත් උපාධි උපදේශන සිසුන්ට, සම්බන්ධතා පිළිබඳ මූලික දැනුමත් සමඟ විවාහ උපදේශනය සඳහා න්‍යායාත්මක ප්‍රවේශයන් ඉගැන්වීම.

### 'උපදේශන අධීක්ෂණය'

ඇමරිකා එක්සත් ජනපදයේ වීටන් විද්‍යාලයේ ආචාර්ය මැන්ඩි කෙලම්ස්-බරකා සමඟින් විශේෂ වැඩමුළුවක්



උපදේශන ක්ෂේත්‍රයේ නියැළෙන්නන් සඳහා විශේෂ වැඩමුළුවක් පවත්වන ලදී. අධීක්ෂණයට භාජනය වන උපදේශකයන්ගේ කුසලතා වර්ධනය කිරීම සඳහා සායනික අධීක්ෂණය උපයෝගී කරගත හැකි ආකාරය මෙම වැඩමුළුවේදී ගවේෂණය කරන ලදී.

# කොළඹ දේවධර්ම ශාස්ත්‍රලයේ ප්‍රකාශන

## කොළඹ දේවධර්ම ශාස්ත්‍රලය ප්‍රකාශන වෙතින් නව පොත් 11ක් එළිදැක්වීම

මෑතකදී පැවති උපාධි ප්‍රදානෝත්සවයේදී කොළඹ දේවධර්ම ශාස්ත්‍රලයේ ප්‍රකාශකයින් විසින් නව පොත් එකොළහක් එළිදක්වන ලදී. මෙම පොත් අතර කොළඹ දේවධර්ම ශාස්ත්‍රලයේ සඟරාවේ (*Journal of CTS*) 19 වන වෙළුම ද, මුල් කෘති මෙන්ම පරිවර්තනය කරන ලද පොත් ද ඇතුළත් විය.

කොළඹ දේවධර්ම ශාස්ත්‍රලයේ ප්‍රකාශන කොහුවල කොළඹ දේවධර්ම ශාස්ත්‍රල පොත්හලෙන් සහ ප්‍රමුඛ පෙළේ පොත් සාප්පුවලින් මිලදී ගත හැකිය.

ප්‍රකාශන නාමාවලිය බැලීමට ක්ලික් කරන්න




## කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සඟරාව (Journal of CTS)




එම සඟරාවේ 19 වන වෙළුමේ සම-සමාලෝචනය කරන ලද ලිපි වන්නේ:

- පටාචාරා කතාව සහ යෝබ් පොත: බෞද්ධ හා බයිබලයානුකූල පරිණාමන, යට අදාළ දුක් විඳීම සහ ඔරොත්තු දෙන ඇදහිල්ල - ජී පී වී සෝමරත්න
- ඩයස්පෝරා සුවිශේෂීතාව: පැරණි ගිවිසුමේ ඉශ්‍රායෙලයේ විසිරීම, අනන්‍යතාව සහ පුනර්ජීවනය පිළිබඳ අත්දැකීම් - ටෙඩී රුබේෂ්
- ක්‍රියා 21:37-22:2 හි දක්නට ලැබෙන ද්විභාෂාව සහ දේවසේවය තුළ භාෂා තෝරා ගැනීම - ෂාරි ද කොස්තා
- පෙන්තකොස්ත-කැරිස්මැටික් අධ්‍යාත්මිකත්වය සහ ධර්මදානී දේවධර්මීය අධ්‍යාපනයේ හැඩගැස්වීම - ජේකොබ් චෙරියන්
- ඩිජිටල් යුගය තුළ සාක්ෂිය සහ ශ්‍රාවකයන් මුහුණ පාන ගැටලු - අයිවෝ පූබාලන්
- ශ්‍රී ලංකාවේ සුබ අස්න ප්‍රකාශ කිරීම: මෙතෝදිස්ත උරුමයෙන් පාඩම් කිහිපයක් - අජිත් ප්‍රනාන්දු

## 2025 උපාධිධාරීන් CTS වෙත පිරිනැමූ විශේෂ තෑගි





කොළඹ දේවධර්ම ශාස්ත්‍රල මූලස්ථානයෙහි උපාධිධාරි සිසුන් විසින් කොහුවල පුස්තකාලයට පොත් නිකුත් කිරීමේ සහ විමර්ශන අංශ සඳහා නව පරිගණක දෙකක් ප්‍රදානය කරන ලදී.

## සමුගැනීම

### රන්මලී සෙනෙවිරත්න

කොළඹ දේවධර්ම ශාස්ත්‍රලයෙහි වසර 13 වැඩි කාලයක් ලේඛකාධිකාරිනිය (රෙජිස්ට්‍රාර්) ලෙස සේවය කළ රන්මලී සෙනෙවිරත්න ජූලි මස අවසානයේදී සිය සේවය අවසන් කළාය. වසර ගණනාවක් පුරා වර්ධනය වෙමින් පැවති කොළඹ දේවධර්ම ශාස්ත්‍රල සේවාවන් වෙත රන්මලී සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. තවදුරටත් විවිධ ක්ෂේත්‍රවල ස්වාමීන් වහන්සේට සේවය කරන්නට යන ඇයට අපගේ සුභ පැතුම්!

## අඛණ්ඩ දීමනාවක් තුළින් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය වෙත උපකාර කිරීමට ඔබ යාච්ඤා පූර්වකව සලකා බලන්නේ ද?

ඔබ වැනි ත්‍යාගශීලී මිතුරන්ගේ උපකාර නිසා කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ නව විශිෂ්ට මානයන් කරා ළඟා වෙමින් සිටී! ඔබගේ දීමනාව මගින් දෙවියන් වහන්සේගේ රාජ්‍යය සඳහා විශිෂ්ටතම සේවකයන් පුහුණු කිරීම කෙරෙහි වෙනසක් ඇති කළ හැකිය.

**1 බැංකු ප්‍රේෂණ සහ විදේශ මුදල් යැවීම (ඇ.ඩො. සහ කැ.ඩො)**

වැඩි විස්තර සඳහා අප අමතන්න

**2 ණයවර පත (ක්‍රෙඩිට් කාඩ්)**

**CTS වෙබ් අඩවිය හරහා ගෙවීම් කරන්නට**

WWW.CTS.LK වෙත පිවිසෙන්න

පිටුවේ ඉහළ දකුණේ තිබෙන 'GIVE TO CTS' බොත්තම ඔබන්න

පරිත්‍යාග කරන්න

**3 චෙක්පත්**

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ **නමට ලියන්න** (ගෙවීම් ලබන්නා) විදුහල්පති, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය, 189, දුටුගැමුණු වීදිය, කොහුවල, ශ්‍රී ලංකාව **වෙත එවන්න**

**4 මුදල් ගෙවීම්**

කොහුවල කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය මූලස්ථානය වෙත පිවිසෙන්න

වැඩි විස්තර සඳහා සම්පත් සංවර්ධන කළමනාකාර, රොෂෙල් හේකල්-රණසිංහ අමතන්න
+94 77 350 2930 | rochelle@cts.lk

WWW.CTS.LK | +94 11 2890809